# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - II වසර

**(පළවන සමෙසේතරය - සිංහල මාධ්‍යය)**

**(පවත්වන ලද්දේ 2025 පෙබරවාරි/මාර්තු)**

# BLM 2131 - සංවිධාන චර්යාව

අයදුම්කරුවන්ට

උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි (03).

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

1. අ.

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ සේවක හැසිරීමයි. එම නිසා සේවක හැසිරීම තේරුම්ගැනීම ඔවුන් සමග වැඩකිරීම පහසුකරවයි. සංවිධාන චර්යාව විෂය පුද්ගලයින් තේරුම් ගැනීම සඳහා ඔවුන්ව අධ්‍යනය කල යුතු මට්ටම් 3ක් සඳහන් කරයි. එම මට්ටම් මොනවාදැයි නම් කර ඒසේ විවිධ මට්ටම් වලින් පුද්ගල හැසිරීම අධ්‍යන කල යුත්තේ ඇයිදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08 යි)

ආ. පුද්ගලයා යනු කවුරුන්දැයි තේරුම් ගැනීමට සුදුසු ආකෘතියක් විස්තර කරන්න.

(ලකුණු 12යි)

**(මුළු ලකුණු 20යි)**

2. අ. පුද්ගල හැසිරීම තීරණය කෙරෙන ප්‍රධාන සාධක මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10යි)

ආ. පුද්ගලයින් සතු කායික හා මානසික කුසලතා මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න

(ලකුණු 10යි)

**(මුළු ලකුණු 20යි)**

3. අ. සංජානනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න

(ලකුණු 08යි)

ආ. අන්තර් පුද්ගල ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ සමාජ සංජානන දෝෂ වේ. සමාජ සංජානනය යනු කුමක්දැයි විස්තර කර නිවැරදි පුද්ගල අවබෝධයට බාධාකරන සංජානන දෝෂ නම් කර ඉන් දෝෂ හතරක් උදාහරණ සහිතව විස්තර කරන්න

(ලකුණු 12යි)

**(මුළු ලකුණු 20යි)**

4. අ. සෑම පුද්ගල සමුහයක්ම කණ්ඩාමක් නොවේ. පුද්ගල සමුහයක් හා පුද්ගල කණ්ඩායමක් අතර වෙනස්කම් පැහැදිලි කර අන් අය සමග වැඩකිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08යි)

ආ. කණ්ඩාමක් වශයෙන් වැඩ කිරීමේදී එහි සාර්ථකත්වය තීරණය කිරීමට බලපාන සාධක මොනවාද ?

(ලකුණු 12යි)

**(මුලු ලකුණු 20යි)**

5. අ. කළමනාකරුවෙකුට බලය අවශ්‍යවන්නේ ඇයි දැයි පැහැදිලි කර බලය හා අධිකාරී බලය අතර ඇති වෙනස විස්තර කරන්න.

(ලකුණු 10යි)

ආ. සාර්ථක කළමණාකරුවෙකු වීමට අධිකාරී බලය පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ මෙම අදහසට එකග වන්නේද ඔබේ මතයට උදහරණ සහිතව හේතු දක්වන්න.

(ලකුණු 10යි)

**(මුලු ලකුණු 20යි)**

6. අ. සංවිධාන ගැටුම් අවමකිරීම සඳහා සංවිධානයකට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ?

(ලකුණු 10යි)

ආ. සංවිධානයක වෙනස්කම් ඇති කිරීමට යාමේදි ඊට සේවකයින් විරුද්ධ වීමට හේතු මොනවාද ?

(ලකුණු 10යි)

**(මුලු ලකුණු 20යි)**

7. අ. සංවිධාන සංස්කෘතිය යනු කුමක්දැයි විස්තර එහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

ආ. සංවිධානයක සංස්කෘතියක් ගොඩනැගීමේ පියවරයන් මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10යි)

**(මුලු ලකුණු 20යි)**

******************